# ශ්‍රී ජීවනාථයන් විසින් විරචිත "භාවකුතුහලය" කෘතියෙහි එන ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණවලින් සිදුවන සන්නිවේදනාර්ථ පිළිබඳ විමර්ශනයක්

නන්දන මිල්ලගල
මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**සංක්ෂිප්තය**

දේහ ලක්ෂණ විද්‍යාව මිනිසා විවිධාකාර ලෙස අවබෝධ කර ගැනීමට උපයෝගී කරගත් ඓතිහාසික ක්‍රමවේදයකි. ස්ත්‍රී-පුරුෂ ශරීරාංග මගින් සන්නිවේදිත අර්ථ එකී මිනිසුන්ගේ ජීවන රටාවන් විනිශ්චය කර ගැනීමට යොදා ගනී. කේශාන්තයේ සිට පාදාන්තය දක්වා බාහිර රූපකායෙහි කුඩා අනුකුඩා සකලවිධ අංග ප්‍රත්‍යංග එහි දී සියුම් නිරීක්ෂණයට ලක් කර ඇත. මානව ශරීරාංග සන්නිවේදනය සඳහා හිතාමතා සවිඥානක ව භාවිත කිරීම මෙන් ම එම ශරීරාංග මගින් සිදු වන සන්නිවේදනාර්ථ පරීක්ෂාව ද එක් ක්‍රමයකි. මෙම විමර්ශනය ජීවනාථ නම් භාරතීය දෛවඥයාගේ "භාවකුතුහලය" නම් ඉපැරණි කෘතියේ ස්ත්‍රී-පුරුෂ ශරීරාංග ආශ්‍රිත ව සන්නිවේදනාත්මක දෘෂ්ටියෙන් අධ්‍යයනය කිරීමට උත්සුක වන්නකි. ජීවනාථගේ ''භාවකුතුහලය'' නම් කෘතියේ ශ්ලෝක 597 කි. ඒවා විෂයානුබද්ධ පරිච්ඡේද 16කින් සමන්විත ය. ඒ අතරින් ප්‍රස්තුත විමර්ශනයට යොදා ගනු ලබන්නේ සාමුද්‍රිකා යනුවෙන් හඳුන්වන පුරුෂ දේහ ලක්ෂණ හා කන්‍යාංග ලක්ෂණ යනුවෙන් හඳුන්වන ස්ත්‍රී දේහ ලක්ෂණ යි. ඒ අනුව හිස, හද, අත් පා ඇතුළු පාදාන්තය දක්වා ශරීර ලක්ෂණ විවිධාකාර ලෙස අර්ථ නිරූපණය වන පරිදි ඉදිරිපත් කර තිබේ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේ ම දේහ ලක්ෂණ මගින් ඔවුනගේ චරිතය, ගුණාගුණ, අනාගත ජීවිතය යනාදිය සන්නිවේදනය වන බව දක්වා තිබේ. ඉපැරණි කෘතියක නූතන සමාජ උපයෝගීතාව කෙසේ දැයි හඳුනාගැනීමට මෙම පර්යේෂණය මගින් හැකි වන අතර මුඛ්‍ය වශයෙන් ලිඛිත මූලාශ්‍රය උපයෝගී කරගෙන ඒවා ප්‍රායෝගික වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය විමසා බැලේ. වසර සිය ගණනකට පෙර භාරතීය සමාජයේ ස්ත්‍රිය හා පුරුෂයා පිළිබඳ, දේහ ලක්ෂණ පදනම් කරගත් තොරතුරු ඇතුළත් භාවකුතුහලය නම් කෘතියේ ප්‍රස්තුත පරිච්ඡේද දෙකක් අපගේ කේන්ද්‍රීය විමර්ශන භූමිය යි. සමාජයේ පුද්ගලයින් කියවා ගැනීමට ස්ත්‍රී-පුරුෂ දේහ ලක්ෂණ, චර්යා සම්බන්ධතා විලාස ආදිය ඇතුළත්, සාක්ෂරතාවක් අවශ්‍ය ය. පැරණි සමාජ ව්‍යවහාරයේ ස්ත්‍රීන්-පුරුෂයින් කියවා ගැනීමට අදාළ ව යොදා ගත් දේහ ලක්ෂණ හා ඊට සම්බන්ධ ඵලාපල කථනය එක් ක්‍රමවේදයකි. ජීවනාථට පෙර ජීවත් වූ ඍෂිහු ඉතා සියුම් ව, ගැඹුරු අවධානයෙන් ස්ත්‍රී හා පුරුෂ සිරුරු පරීක්ෂාවට ලක් කර ඇත. ඔවුන් යහපත්-අයහපත්, ගුණාගුණ, හොඳ-නරක, ශුභ-අශුභ වැනි විනිශ්චයන් සිදු කරන්නේ තත්කාලීන සමාජ සාරධර්ම හා පිළිගැනීම් මත පිහිටා ය. ස්ත්‍රී-පුරුෂ ශරීරාංග ශුභ හෝ යහපත් පාර්ශ්වයේ පිහිටි අයකුගේ ජීවිතය වඩාත් උසස් වින්දනයකින් සමන්විත වේ. එය ජීවිතයේ අර්ථ, ධර්ම හා කාම යන ත්‍රිවිධ සම්පත් ලඟා කර ගැනීමට හේතුවකි.

**ප්‍රමුඛ පද:** භාවකුතුහලය, සාමුද්‍රිකා, කන්‍යාංග ලක්ෂණ, සන්නිවේදනාර්ථ, දේහ ලක්ෂණ

**විද්‍යුත් ලිපිනය:** nandana.millagala58@gmail.com